## අළු බදාදාට පසු සෙනසුරාදා

**පළමුවන දේව ප්‍රකාශනය** යෙසායා 58: 9–14

යෙසායා දිවැස්ප්‍රසාදිතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

*ඒ දවසේ දී නුඹලාගේ ම මාවත් වල නොගොස්*
*දෙවි සමිඳාණන්ට මහිමය දෙන්න.*

“එකල නුඹලා යාච්ඤා කරන විට මම පිළිතුරු දෙන්නෙමි. මට නුඹලා හඬ නගන විට ‘මම මෙහි ය’ යි පිළිතුරු දෙන්නෙමි. නුඹලා අනුන්ට කරන බලහත්කාරකම් ද, අනුන් හෙළා දැකීම ද, නපුරු ලෙස කතා කිරීම ද නුඹලා වෙතින් පහ කරන්නහු නම්, සාගිනි ඇත්තාට අනුකම්පා කර, අසරණයන් තෘප්තියට පමුණුවන්නහු නම්, නුඹේ අඳුර එළිය වන්නේය. ඝනාන්ධකාරය මද්දහන මෙන් එළිය වන්නේය. මම නිතරම නුඹලාට මඟ පෙන්වා යහපත් දෙයින් තෘප්තියට පමුණුවා සතිප ශක්තිය නුඹලාට ගෙන දෙන්නෙමි. නුඹලා ජලයෙන් සාරවත් උයනක් මෙන් ද, දිය නොසිඳී යන උල්පතක් මෙන් ද වන්නහුය. නුඹලාගෙන් පැවත එන බොහෝ කලක් නටඹුන්ව තිබුණු තැන් ගොඩනගනු ලබන්නේය. පැරණි අත්තිවාරම් පිට ගොඩනැගිලි නැවත ඉදි කරනු ලබන්නේය. කැඩුම් බිඳුම් සෑදූ වාසය පිණිස නටඹුන් නැවත අලුත්වැඩියා කළ අය වශයෙන් නුඹලා හඳුන්වනු ලබන්නහු ය.

“සමිඳාණෝ මෙසේ වදාරණ සේක. “නුඹලා සබත් දවස ශුද්ධ ලෙස පවත්වා, ඒ දවසේ දී ගනුදෙනු නොකර, සමිඳුන්ගේ සබත ප්‍රිය වන ගෞරවණීය දවසක් යයි කියන්නහු නම්, ඒ දවසේ දී ගමන් බිමන් නොගොස්, ගනුදෙනු නොකර, අල්ලාප සල්ලාප නොදොඩා ඒ දවසට ගෞරව කරන්නහු නම්, මට සේවය කිරීමෙන් ඇති වන ප්‍රීතිය නුඹලා භුක්ති විඳින්නහු ය. ලොවෙහි උසස් ම ගෞරවය නුඹලාට අත් කර දෙන්නෙමි. නුඹලාගේ පිය වූ ජාකොබ්ට උරුමයක්

වශයෙන් දුන් දේශය නුඹලා භුක්ති විඳින්නහුය. මෙසේ වදාරන්නේ සමිඳුන් වන මම ය.”

දේව වචනය මෙසේ ය.

| පිළිතුරු ගීය | ගීතාවලිය 86: 1–6 |
|---|---|

පිළිතුර: සමිඳුනි, ඔබේ සත්‍යයෙහි ගමන් කරන පිණිස මට මඟ පෙන්නුව මැනව.

ගීය:

සමිඳුනි, ඔබ කන් යොමා මට පිළිතුරු දුන මැනව. මන්ද, මම අසරණය. මම දුබල ය. මා භක්තිවන්ත වන බැවින් මා මරණින් මුදනු මැනව. ඔබ කෙරෙහි විශ්වාස කරන ඔබේ දාසයා මුදාලුව මැනව.

මාගේ සමිඳුනි, මට අනුකම්පා කළ මැනව. මුළු දවස පුරා මම ඔබට අයැදිමි. ඔබේ දාසයාගේ සිත ප්‍රීතිමත් කළ මැනව. මන්ද, මාගේ සමිඳුනි, මම ඔබට යාච්ඤා කරමි.

මාගේ සමිඳුනි, ඔබ යහපත් ය. ඔබ කමා කරන සේක. ඔබට අයැදින සියල්ලන්ට තිර පෙම බහුලව ප්‍රදානය කරන සේක. සමිඳුනි, මාගේ අයැදුමට සවන් දුන මැනව. පිහිට පතමින් මා කරන අයැදුමට කන් දුන මැනව.

| සාධුකාරය (දෙවසරේම) |
|---|

“දුජ්ඨයා තමාගේ මාර්ගයෙන් හැරී ජීවත්වනවාට මිස,
ඔහු නසිනවාට මම ප්‍රසන්න නොවෙමි” යි
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ වදාරණ සේක.
ඉශ්රායෙල් ජනයෙනි, හැරෙන්න,
නුඹලාගේ නපුරු මාර්ගවලින් හැරෙන්න.

**සුවිශේෂය** **ලූක් 5: 27−32**

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

*මා ආයේ පව්ටුන් මනස්ථාපනයට කැඳවීම පිණිස ය.*

ඉක්බිති උන්වහන්සේ නික්ම ගොස් ලෙවී නම් අයකැම්යෙකු බදු පොළේ හිඳිනු දැක, “මා අනුව එන්නැ”යි ඔහුට වදාළ සේක. ඔහු සියල්ල අත්හැර දමා නැගිට උන්වහන්සේ අනුව ගියේය. ලෙවී සිය නිවසෙහි උන්වහන්සේට මහා භෝජන සංග්‍රහයක් පිළියෙල කළේය. අයකැම්යන් සහ වෙනත් අයගෙන් මහ පිරිසක් ඔවුන් සමග කෑමට හිඳ ගත්හ. එකල පරිසිවරු ද ඔවුන්ගේ විනයධරයෝ ද උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට විරුද්ධව චෝදනා කරමින් “ඔබ අයකැම්යන් ද පව්කාරයන් ද සමග කන්නේත් බොන්නේත් මන්දැ”යි ඇසූහ.

ජේසුස් වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින් “රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදාගෙන් වැඩක් නැත. මා ආයේ පව්ටුන් මිස දම්ටුන් මනස්ථාපනයට කැඳවීම පිණිස නොවේය”යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.